**Ministry of Education**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

"Isurupaya", Sri Jayawardhanapura Kotte, Battaramulla
"ඉසුරුපාය", ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, බත්තරමුල්ල
Tele/දුරකථන: 2785141-50 Fax/ෆැක්ස්: 2784846 Email/ඊමේල්: isurupaya@moe.gov.lk Web/වෙබ්: www.moe.gov.lk

2009.01.13

**ප්‍රවෘත්ති නිවේදනයයි**

**<u>අ.පො.ස. (සා.පෙළ) ගණිත ප්‍රශ්ණ පත්‍රය 2008, 11 කොටස</u>**

අ.පො.ස. (සා. පෙළ) නව විෂයය නිර්දේශය යටතේ 2008 ගණිතය 11 වන කොටසේ ප්‍රශ්න පත්‍රය අවලංගු කිරීම නිසා 2009 ජනවාරි 24 වන දින යලි පැවැත්වෙන එම විභාගයට අදාළව විශේෂ වැඩසටහන් පළාත් මට්ටමෙන් පැවැත්වීමට සැලසුම් සකස් කර ශිෂ්‍යයන් පුහුණු කටයුතුවල යෙදවීමට ද, ශිෂ්‍යයන් පාසලට ගෙන්වා විශේෂ සම්මන්ත්‍රණ හා විවිධ වැඩසටහන් මගින් අදාල විෂය නිර්දේශයට අනුකූල ආදර්ශ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලියවමින් උපකාරී වැඩසටහන් එදිනට පෙර ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා ලෙස ද අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් නිමල් බණ්ඩාර මහතා සියලුම පළාත් අධ්‍යක්ෂවරුන් දැනුවත් කර තිබේ.

මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර කලාප අධ්‍යක්ෂවරුන්, කොට්ඨාස අධ්‍යක්ෂවරුන් හා ගණිත විෂය භාර අධ්‍යක්ෂවරුන්, ගණිත විෂය උපදේශකවරුන් මෙහෙයවමින් පාසල් ප්‍රධානීන් මේ ගැන දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසත්, 2009 ජනවාරි 19 සිට 23 දක්වා කාලය තුළ ළමුන් පාසලට ගෙන්වා අවශ්‍ය පරිදි සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කර ලෙසත්, අධ්‍යාපන අමාත්‍යාංශය අවධාරණයෙන් කියා සිටියි.

මෙහි වගකීම පළාත් ගණිත විෂය භාර අධ්‍යක්ෂවරයාට පැවරිය යුතු අතර, ක්‍රියාත්මක කරන ලද වැඩසටහන පිළිබඳව වාර්තාවක් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්වරයාට එවන ලෙසත් අධ්‍යාපන අමාත්‍යාංශය උපදෙස් දෙයි.

ජයවීර දෙල්පාගොඩ
මාධ්‍ය ලේකම්

ජයවීර දෙල්පාගොඩ
ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ
මාධ්‍ය ලේකම්
(සාම විනිසුරු)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය", බත්තරමුල්ල.

**MediaUnit**

Tele/දුරකථන: 2784869 Fax/ෆැක්ස්: 2784869 Email/ඊමේල්: mediaunitmoe@yahoo.com

**Media Release.**

**G.C.E.(Ordinary Level) Mathematics Question Paper 2008- Part II**

Owing to the cancellation of the question paper in Part II Mathematics 2008 under the New Syllabus of the G.C.E.(Ordinary Level) a new examination will be held for this subject on 24th January 2009 and for this purpose Mr.Nimal Bandara has notified all Provincial Directors of Education to arrange special programs on Provincial level for the participation of students for training activities and to implement these support programs before this date enabling students to answer model question papers prepared in conformity with the relevant syllabus at special seminars and various other programs conducted for the students by calling them to the school.

Ministry of Education has stressed that special attention should be drawn to this matter and while directing all Zonal Directors, Divisional Directors , Directors in charge of the Mathematics subject and Mathematics Advisors to provide awareness for all Heads of Schools and also to conduct suitable programs as necessary by calling students to the school during the period from 19th to 23rd January 2009.

The responsibility on this matter should be entrusted to the Director in charge of the Mathematics subject and a report on the program implemented accordingly should be forwarded to the Secretary, Ministry of Education.